සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

13 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- නිවැරදි හා වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.

---

01. සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භය සනිටුහන් කරන්නේ,
(1) මාධ්‍යයයි. (2) සන්නිවේදනයයි. (3) අත්දැකීම් පසුතලයයි.
(4) සන්දර්භයයි. (5) විකේතිකරණයයි.

02. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය යනු,
(1) සන්නිවේදන තත්වයේ ප්‍රගතිය දක්වන්නකි.
(2) සීමිත පිරිසක් පමණක් සිදු කරන්නකි.
(3) ග්‍රහකයා දැනුවත් කිරීමේ ක්‍රම වේදයකි.
(4) එකම පුද්ගලයකු තුළ සිදුවන ආත්ම භාෂණයයි.
(5) ප්‍රතිපෝෂණය අරඹයා සිදු කරන තොරතුරු දැක්වීමයි.

03. සන්නිවේදකයා හා ග්‍රාහකයා සමාන කොට දක්වන සන්නිවේදන ආකෘතිය වන්නේ
(1) ෂැනන් වීවර් ආකෘතිය (2) ඇරිස්ටෝටල් ආකෘතිය
(3) SMCR ආකෘතිය (4) ලැස්වෙල් ආකෘතිය
(5) ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය

04 මානව භාෂාව ආරම්භ වන්නේ,
(1) උපතින් ගෙන ආ පුරුද්දක් ලෙස ය. (2) දෙවියන්ගෙන් ලද දායාදයක් ලෙස ය.
(3) යකුන්ගෙන් සම්භවය ලැබූ දෙයක් ලෙස ය. (4) මිනිසාගේ ශ්‍රම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙසය.
(5) මිනිසා පරිසරයෙන් උගත් දෙයක් ලෙස ය.

05 අර්ථ බාධක එල්ල විය හැක්කේ,
(1) පණිවිඩයට ය. (2) මාධ්‍යයට ය. (3) ග්‍රාහකයාට ය.
(4) සන්නිවේදකයාට ය. (5) සන්දර්භයාට ය.

06 සන්නිවේදනය හා සමාජය අතර ඇති සබඳතාව විග්‍රහ කරන්නේ,
(1) ලැස්වෙල්ගේ නිර්වචනය (2) එඩ්වඩ් ෂැපීගේ නිර්වචනය
(3) විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනය (4) ෂැනොන් වීවර්ගේ නිර්වචනය
(5) ඩේවිඩ් කේ. බර්ලෝගේ නිර්වචනය

07 ජනමාධ්‍ය බලපෑම මගින් ජනතාව වෙත පැවරෙන සන්නිවේදන සංකල්පය වන්නේ,
(1) නිදහස් මතවාදී සංකල්පය. (2) සමාජ වගකීම් පිළිබඳ සංකල්පය.
(3) අධිපතිවාදී සංකල්පය. (4) සමාජවාදී සන්නිවේදක සංකල්පය.
(5) ප්‍රජාතන්ත්‍රීකරණ සංකල්පය.

08 විධිමත් සන්නිවේදනය පිළිබඳව නිවැරදි ප්‍රකාශ වන්නේ
A විධිමත් සන්නිවේදනයට වඩා අවිධිමත් ය . වේගවත් ය.
B විධිමත් අවිධිමත් සන්නිවේදනයක් සැසඳිය නොහැක.
C විධිමත් ආයතනයක සංවිධාන ව්‍යුහයක් මත පවතී.
D චක්‍රලේඛ රැස්වීම්, යෝජනා පෙට්ටි ක්‍රම භාවිතා වේ.
(1) B පමණි. (2) A,C,D
(3) B, C, D (4) D පමණි.
(5) A,C, B, D

09 විශාල සම්මන්ත්‍රණ ශාලාවක දේශනයකට පැමිණෙන කථිකයාට ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන උපකරණය වන්නේ,

(1) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (2) ශබ්ද විකාශන යන්ත්‍රය

(3) රැහැන් රහිත මයික්‍රෆෝනය (4) උහිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රය

(5) පිටු පෙරලනය

10 තම මුණුපුරා සතුටු කිරීමට කතාන්දර සෑදීම හා ඒවා කියා සතුටුවීම අත්තම්මාගේ සිරිතය. මෙහි දක්නට ලැබෙන සන්නිවේදන වර්ග වන්නේ,

(1) සමූහ සන්නිවේදනය හා පුද්ගලාන්තර සන්නිවේදනය.

(2) අන්තර්වර්ති හා පුද්ගලාන්තර සන්නිවේදනය.

(3) ස්වයං හා ජන සන්නිවේදනය.

(4) පුද්ගලාන්තර හා ජන සන්නිවේදනය.

(5) සමූහ හා ජන සන්නිවේදනය

11 මිනිසා තම දෛනිකව කටයුතු සඳහා භාවිතා කරන්නේ

(1) ජීව භාෂාව (2) උප භාෂාව (3) ප්‍රාදේශීය භාෂාව

(4) මෘත භාෂාව (5) සම්මත භාෂාව

12 රූපවාහිනි මාධ්‍ය තුළ ප්‍රධාන සන්නිවේදක ප්‍රකාශන රටාව වන්නේ,

(1) විවරණය හා කථනය (2) ලේඛනය හා රූපනය

(3) රූපණය හා කථනය (4) ශ්‍රවණය හා විවරණය

(5) ලේඛනය හා භාෂණය

13 ජනමාධ්‍යවේදියා යනු,

(1) ප්‍රවෘත්ති වාර්තාකරණයේ නිරතවන තැනැත්තා ය.

(2) මාධ්‍ය සන්දේශ මගින් නව දැනුම සම්පාදනය කරන්නාය.

(3) මාධ්‍ය වෘත්තිකයන් පුහුණු කරන්නාය.

(4) මාධ්‍ය සංදේශ සකසන්නා ය.

(5) මාධ්‍ය දොරටුපාලකයා ය.

14 වැඩිහිටියන් හා එක්ව ළමුන් තේරවිලි තේරීම අයත් වන්නේ,

(1) සංස්කෘතික කාර්යයට හා විනෝදාස්වාද කාර්යයට ය.

(2) තොරතුරු සම්පාදන හා පෙළඹවීම කාර්යයට ය.

(3) අධ්‍යාපන හා තොරතුරු සම්පාදන කාර්යයට ය.

(4) සංස්කෘතික හා පෙළඹවීම කාර්යයට ය.

(5) සමාජ සංවිධාන හා මතවාදී කාර්යයට ය.

15 A මාධ්‍ය නිදහසේ ගලා යයි.

B රජය මගින් අන්තනෝමතිකව පාලනය වේ.

C පාලක ප්‍රතිරූප ගොඩ නංවයි.

ඉහත කරුණුවලට අදාළව පිළිවෙලින් සංකල්ප දැක්වෙන්නේ,

(1) නිදහස් මතවාදී, සමාජ වගකීම් , අධිපතිවාදී

(2) අධිපතිවාදී, ප්‍රජාතන්ත්‍රීකරණ ,සමාජ වගකීම් ,

(3) නිදහස් මතවාදී, අධිපතිවාදී, අධිපතිවාදී

(4) නිදහස් මතවාදී, සමාජ වගකීම්, කොමියුනිස්ට්වාදී

(5) අධිපතිවාදී, සමාජවාදී, නිදහස් මතවාදී

16 අවාචික සන්නිවේදනයට අදාළ නොවන ප්‍රකාශය වන්නේ,

(1) අඛණ්ඩ ක්‍රියාවලියකි. (2) ස්වාභාවික ක්‍රියාවලියකි.

(3) ව්‍යාකරණ ක්‍රියාවලියකි. (4) කාර්යක්ෂම වේ.

(5) දෘශ්‍ය සන්නිවේදනය ද අයත් ය.

The National e-learning Portal for the General Education

17 තොරතුරු සමාජය සංකල්පය

(1) තොරතුරු හා ආර්ථිකය අතර සම්බන්ධය පහදයි.

(2) තොරතුරු විරල තත්වයකි.

(3) සාම්ප්‍රදායික වටිනාකම ඉස්මතු කරයි.

(4) ඉක්මන් වෙනසක් සිදු නොවේ.

(5) විශ්වාසනීය නොවේ.

18 සමාජයක පවතින සන්නිවේදන රටා සම්බන්ධයෙන් ප්‍රකාශ හතරක් පහත වේ.

A ආර්ථික පදනම හා සබැඳීය.

B සංස්කෘතික රටාවක් සමග සම්බන්ධය.

C ජනශ්‍රැතිය හා සම්බන්ධය.

D ජනඇදහිලි හා සම්බන්ධ වේ. මේ අතරින් නිවැරදි වන්නේ

(1) A,B,C, (2) A, B

(3) A, හා C (4) A, B,C, D

(5) A, B, D

19 පුරවැසියාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් තහවුරු කරන මාධ්‍යකරණය වන්නේ,

(1) පුවත්පත් මාධ්‍යකරණය (2) විකල්ප මාධ්‍යකරණය

(3) පුරවැසි මාධ්‍යවේදය (4) නව මාධ්‍ය

(5) ගවේෂණාත්මක මාධ්‍යකරණය

20 වෙනත් අයෙකුගේ හැසිරීම් රටා තමාට පවරා ගැනීම හඳුන්වන්නේ

(1) අනුකරණය (2) භූමිකාකරණය (3) අනුවර්තනය

(4) කදාත්මීයකරණය (5) සමාරෝපණය

21 සාමූහික ගුණාංග අයත් වරණය වන්නේ,

(1) සාමූහික හැඟීම, එකමුතු කම, අරමුණු, විසම්මුතිය

(2) ගැටලු විසඳීම, සන්නිවේදන මාර්ග, සහජීවනය, අරමුණු

(3) ප්‍රතිමාන, නායකත්වය, එකමුතු කම, අවබෝධය

(4) විසම්මුතිය, මිත්‍රත්වය, විවිධ භූමිකා, අවබෝධය

(5) අරමුණු, ප්‍රතිමාන, විසම්මුතිය, නායකත්වය

22 තැපැල් නිලධාරියා , විදුලි පණිවිඩයක් ලිවීමේදී භාෂාවේ පද බෙදීම නිවැරදි නොවීම නිසා නිරි පරිදි වටහාගත නොහැකි වීම.

(1) මාධ්‍ය බාධකයකි. (2) පාරිසරික බාධකයකි. (3) භාෂා බාධකයකි.

(4) අර්ථ බාධකයකි. (5) යාන්ත්‍රික බාධකයකි.

23 නව මාධ්‍යයේ භාෂා භාවිතය පිළිබඳව සාවද්‍ය ප්‍රකාශයකි.

(1) බොහෝ විට ජාත්‍යන්තර භාෂා භාවිතා වේ.

(2) කෙටි පද බහුල ය.

(3) භාෂාවට අමතරව දෘෂ්‍ය සංකේත ද භාවිතා වේ.

(4) සංක්ෂිප්ත භාෂා භාවිතයන් දක්නට ලැබේ.

(5) ව්‍යාකරණ දෝෂ කිසිවක් නැත.

24 ජන මාධ්‍යයේ භාෂා භාවිතය සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) මාධ්‍යමය රටාවන්ට ලක්වේ.

(2) සරල විය යුතු ය.

(3) සන්දේශ ආකෘතිය අනුව භාවිතා කළ යුතු ය.

(4) සැම විටම නිර්මාණශීලි විය යුතු ය.

(5) ද්වි භාෂා භාවිතය පිළිබඳව සැලකිය යුතු ය.

25 ප්‍රවෘත්ති වාර්තාවක මූලික ස්වරූපය

(1) විෂය මූලික වේ. (2) නිර්මාණශීලි වේ.

(3) සිදුවීම් කිහිපයක් කේන්ද්‍ර වේ. (4) උණුසුම් වේ.

(5) ගැටුම්කාරී වේ.

26 මහජන සම්බන්ධතාවය පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ. නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A සෘජුවම අලෙවි ප්‍රවර්ධනය බලාපොරොත්තු වේ.

B හොඳ හිත පවත්වා ගැනීම මූලික අභිප්‍රාය වේ.

C ව්‍යාපාරික ආයතනවලට අත්‍යාවශ්‍ය නොවේ.

D පවුලකට පුද්ගලයෙකුට රජයට වුවද ප්‍රයෝජනවත් ය.

(1) A,B,D, නිවැරදිය . (2) B , D නිවැරදිය.

(3) B, පමණක් නිවැරදිය . (4) A, B,C, D නිවැරදිය.

(5) A, D නිවැරදිය .

- පහත ප්‍රකාශ ඇසුරෙන් 27, 28 සඳහා පිළිතුරු සපයන්න.

A පිටපත් වැඩි සංඛ්‍යාවක් මුද්‍රණය කිරීමේදී එක් පිටපතකට වැයවන පිරිවැය අවම වේ.

B මූලික වර්ණ හතරක් යටතේ මුද්‍රණය වේ.

C කැපුම්පත් (ස්ටෙන්සිල් ) භාවිත කෙරේ.

D කඩදාසි, බෝඩ්, තහඩු , විදුරු, සෙරමික් රෙදි ආදි ඕනෑම මතුපිටක මුද්‍රණය කළ හැකිය.

E මුද්‍රණ තහඩුවක් ආධාර කර ගනියි.

27 මේ අතරින් සමතල මුද්‍රණයට අදාළ වන්නේ,

(1) A, B, E (2) C 3) C, E (4) A, B, C, (5) E

28 මේ අතරින් තිර මුද්‍රණයට අදාළ වන්නේ,

(1) A, B, C, D (2) C, D (3) C, E, B (4) E, C (5) A, D

29 මාධ්‍ය ප්‍රතිරූප සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) පුද්ගල සමාජ ජීවිතය හැඩ ගැස්වීමට හේතු වෙයි.

(2) මාධ්‍ය මගින් මතුකරන චරිත, සිදුවීම් මත ගොඩ නැඟෙයි.

(3) ඒකාකෘතිකරණය සිදුවෙයි.

(4) පෙළඹවීමේ කාර්යය සිදුවෙයි

(5) යථාර්ථය නියෝජනය කරයි.

30 මාධ්‍ය සංස්කෘතියේ සංසරණයේ සමබරතාවය නිසා

(1) ධනවත් රටවල් ලාභ උපයයි. (2) සංස්කෘතික හුවමාරුව සිදුවෙයි.

(3) බටහිර සංස්කෘතික ලක්ෂණ ව්‍යාප්ත වේ. (4) පෙරදිග සංස්කෘතිකාංග මුල්තැන ගනී.

(5) සංස්කෘතික අනන්‍යතාවය සුරැකේ.

31 භාෂණි හා රුවනි අන්තර්ජලය හරහා වීඩියෝ ඇමතුමක් ගනිමින් සිටියි. මෙම අවස්ථාව හැඳින්විය හැක්කේ,

(1) අන්තර්ජාල සන්නිවේදනය. (2) විශ්ව සන්නිවේදනය.

(3) ජන සන්නිවේදනය. (4) පුද්ගලාන්තර සන්නිවේදනය

(5) ද්විමාර්ගික සන්නිවේදනය

32 සාමූහිකව කටයුතු කිරීමේදී සෘජුව පවරා නැති සමහර කටයුතු සිදු කිරීමට වක්‍රව බැඳීමක් ඇති අවස්ථා හමුවේ. එවැනි දෑ,

(1) වගකීම (2) යුතුකම (3) ආචාර ධර්ම

(4) වගවීම (5) අයිතිවාසිකම්

33 එක්තරා ආයතනයක් තම ආයතනයේ ප්‍රගතිය පිළිබඳ දැනුම්දීමට මාධ්‍ය සාකච්ඡාවක් කැඳවා තිබුණි. එය ඵලදායි සන්නිවේදන ක්‍රියාවලියක් වීමට නම්,

(1) පැමිණෙන අයට හොඳින් සංග්‍රහ කළ යුතු ය.

(2) එකම අරමුණක් ඔස්සේ සාකච්ඡාව පැවැත්විය යුතු ය.

(3) කාල කළමනාකරණය විය යුතු ය.

(4) ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් දිය යුතු ය.

(5) තොරතුරු ගොනුවක් ලබාදිය යුතු ය.

34 අලෙවිකරණ මිශ්‍රයට අදාළ මූලිකාංග ඇතුළත්වරණය වන්නේ,
(1) නිෂ්පාදිතය, මිළ, ප්‍රසාරණය, ප්‍රවර්ධනය
(2) නිෂ්පාදිතය, මිළ , බෙදාහැරීම, ප්‍රවර්ධනය
(3) ප්‍රචාරණය, ප්‍රසිද්ධිය, පෞද්ගලික අලෙවිය, මහජන සබඳතා
(4) ප්‍රසිද්ධිය, මිල, ප්‍රවර්ධනය, බෙදාහැරීම
(5) පාරිභෝගිකයා, මිල, ප්‍රවර්ධනය, නිෂ්පාදිතය

35 මාධ්‍ය දැන්වීම්කරණයට අදාළ නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.
(1) සමාජය තුළ පාරිභෝජන අවශ්‍යතා නිර්මාණය කරයි.
(2) සමාජ චර්යාවන් වෙනස් කරයි.
(3) භාණ්ඩ හා සේවා ගැන තොරතුරු ජනතාගත කරයි.
(4) සමාජයට අත්‍යවශ්‍ය නොවේ.
(5) දේශපාලනික වශයෙන් ද යොදා ගනී.

36 නව ලිබරල් වාදයේ පැවැත්මට හේතුවන සංකල්ප වන්නේ,
(1) ගෝලීයකරණය, සමාජ සුබසාධනය
(2) ගෝලීයකරණය, මූල්‍ය ස්වාධිකාරීත්වය, පෞද්ගලීකකරණය
(3) බල කේන්ද්‍රණය, ජාතිකකරණය
(4) කලාපීයකරණය, ප්‍රජාතාන්ත්‍රිකරණය, සමාජ සුබසාධනය
(5) ස්වදේශිකත්වය, මාධ්‍ය සංස්කෘතිය, පෞද්ගලීකකරණය

37 ඥාණ ගවේෂණය යනු,
(1) වර්තමාන සමාජයේ දක්නට ඇති දැනුම කේන්ද්‍ර වූ ක්‍රියාවලියයි.
(2) මානව ශිෂ්ටාචාරයේ ඓතිහාසික ගමන්මගේ සිතියමයි.
(3) ලොව අනාවරණය කර ගැනීමයි.
(4) සන්නිවේදන දියුණුව නිසා ඇති වූවකි.
(5) ගෝලීයකරණයේ ප්‍රතිඵලයකි.

38 සමූහ සන්නිවේදනයට අයත් නොවන්නේ,
(1) කාර්ය මණ්ඩල රැස්වීමක් (2) ප්‍රජා අධ්‍යාපන ප්‍රචාරක රැස්වීමක්
(3) දුරකථන සංවාදයක් (4) විභාග සම්මන්ත්‍රණයක්
(5) ධර්ම දේශනාවක්

39 යම් කාලයක් තුළින් ලබාදෙන පණිවිඩයක් ග්‍රාහකයෙකු විසින් තම දැනුම අනුව අවබෝධ කර ගැනීම.
(1) සමාජානුයෝජනයයි. (2) විකේතිකරණයයි.
(3) ස්වයං සන්නිවේදනයයි. (4) ආකේතකරණයයි.
(5) ජව සංකල්පයයි.

40 ෂැනන් වීවර් ආකෘතියේ ඌනතාවයක් ලෙස දැකිය හැක්කේ,
(1) බාධක හඳුනා ගැනීමට තිබීමයි.
(2) ආකේතකරණ ක්‍රියාවලියයි.
(3) ප්‍රතිපෝෂණය කෙරෙහි අවධානය යොමු නොකිරීමයි.
(4) යාන්ත්‍රික ස්වරූපය පෙන්වා දීමයි.
(5) අග්‍රස්ථානයක් තිබීමයි.

41 සන්නිවේදනයේ කාර්යභාරයක් නොවන්නේ,
(1) පරිසර ආරක්ෂකයෙකුගේ කාර්යභාරය
(2) ගුරුවරයෙකුගේ කාර්ය භාරය
(3) සංස්කෘතිය රකින්නෙකුගේ කාර්යභාරය
(4) පෙළඹවීමේ කාර්යභාරය
(5) ප්‍රඥාවෙන් තොර විනෝදය සැපයීමේ කාර්යභාරය

The National e-Learning Portal for The General Education

42 දෘශ්‍ය සන්නිවේදනයට මිනිසා හුරුවූයේ,

(1) ශිලා යුගයේ දී
(02) දඩයම් යුගයේදී
(3) වහල් සමාජ අවධියේදී
(4) ධනවාදී සමාජ අවධියේදී.
(5) වැඩවසම් යුගයේදී

43 ගෝලීයකරණයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

(1) වාර්ගිකත්වය අගය කිරීම.
(2) පාර ජාතික ආයතන බිහිවීම.
(3) ආවේණික සංස්කෘතිකාංග රැකීම.
(4) ජාතික වටිනාකම් අගය කිරීම.
(5) ද්‍රව්‍යමය ආර්ථිකය වැඩිදියුණු කිරීම.

44 පුද්ගලයෙකුගේ මානසික ක්‍රියාවලිය හා සම්බන්ධ අදහසක් නොවන්නේ,

(1) පුද්ගල චර්යාව ඔහුගේ මනස මුල්කරගෙන සිදුවේ.
(2) පංචේන්ද්‍රියන් මගින් සංවේගයක් ලබාගනියි.
(3) පුද්ගල සංජානනය විවිධත්වයක් ගනු ලබන්නේ මානසික ක්‍රියාවලියේ ස්වභාවය අනුවය.
(4) සෑම පුද්ගලයෙකුගේම මානසික ක්‍රියාවලිය ඒකාකාරීව සිදුවේ.
(5) චිත්තවේගවල ස්වභාවය පුද්ගලානුබද්ධය.

45 පුවත්පත් භාෂා භාවිතයේදී අසත්‍ය කරුණු වන්නේ,

(1) සරල, සුමට භාෂාවක් යොදා ගැනීම.
(2) කෙටි වැකි භාවිතය
(3) විදග්ධ භාෂාවක් නොවීම.
(4) ප්‍රාදේශීය භාෂාවක් භාවිතා කිරීම
(5) සංඛ්‍යා දත්ත පැහැදිලිව ඉදිරිපත් කිරීම.

46 සන්නිවේදන ක්‍රියාවලියේ තොරතුරු ගෙනයන වාහකයා,

(1) නැලියයි
(2) සංදේශයයි
(3) සංකේතයයි
(4) සන්දර්භයයි
(5) විද්‍යුතයයි

47 ලුහුඬු ව්‍යවහාර බහුලවම දක්නට ලැබෙන්නේ

(1) පුවත්පතේ
(2) වාර ප්‍රකාශනවල
(3) නව මාධ්‍යවල
(4) විද්‍යුත් මාධ්‍යවල
(5) සිනමාවේ

48 ඥාති සබඳතා මත නිර්මාණය වන සංස්කෘතිය

(1) වාර්ගික සංස්කෘතිය
(2) ගැමි සංස්කෘතිය
(3) ජාතික සංස්කෘතිය
(4) ජන සංස්කෘතිය
(5) මාධ්‍ය සංස්කෘතිය

49 පහත සඳහන් භාෂා අතරින් ජීව භාෂා අතරට නොගැනෙන්නේ,

(1) සිංහල ඉංග්‍රීසී සංස්කෘත
(2) පාලි ලතින් හීබෲ
(3) දෙමළ පාලී ස්පාඤ්ඤ
(4) හිංදි ප්‍රංශ සංස්කෘත
(5) උර්දු තෙලිඟු මලයාලි

50 අධ්‍යාත්මික සංස්කෘතියට ඇතුළත් නොවන්නේ,

(1) ආගම
(2) කලාව
(3) දර්ශනය
(4) පුරාණෝක්ති
(5) දේශපාලනය

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- තෝරාගත් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් හිමිවේ.

---

01 (1) භාෂා උපාර්ජනය යනු කුමක්ද?
(2) ජනමාධ්‍ය තුළ අසම්මත භාෂාව භාවිතා වන ආකාරය ගැන කරුණු 4ක් දක්වන්න.
(3) භාෂා භාවිතයේ ප්‍රභේද නම් කොට ජනමාධ්‍ය තුළ එය නිරූපණය වන අවස්ථා 1 බැගින් දක්වන්න.
(4) ගෝලීයකරණය හේතුවෙන් මාධ්‍ය තුළ සිදු වූ වෙනස්වීම සාකච්ඡා කරන්න.

02 (1) ශ්‍රවණයට අදාළ කොටස් 4ක් දක්වන්න.
(2) අන්තර්පුද්ගල සන්නිවේදන නිපුණතා සියල්ල නම් කරන්න.
(3) ශ්‍රවණ නිපුණතාවය පැහැදිලි කර දුර්වල ශ්‍රවණ තත්වයක් ඇතිවීමට හේතු පහදන්න.
(4) සමූහ සන්නිවේදනය යන්න පැහැදිලි කොට සමූහ සන්නිවේදන නිපුණතා මගින් සන්නිවේදන ක්‍රියාවලිය ශක්තිමත් වන අයුරු පහදන්න.

03 (1) සංස්කෘතිය පිළිබඳව රැල්ෆ් ලින්ටන්ගේ නිර්වචනය ලියා දක්වන්න.
(2) මාධ්‍ය හා සංස්කෘතිය අතර සබඳතාවය පහදන්න.
(3) ජනප්‍රිය සංස්කෘතිය යනු කුමක් ද? එහි ලක්ෂණ 4 ක් දක්වන්න.
(4) මාධ්‍ය සංස්කෘතියේ සමාජ බලපෑම් පිළිබඳව විස්තරාත්මක විමසුමක් කරන්න.

04 (1) මහජන සම්බන්ධතා ක්‍රියාවලියේ මහජනයා අර්ථ දක්වන්න.
(2) මහජන සම්බන්ධතා විධි හා මෙවලම් නම් කරන්න.
(3) මාධ්‍ය නිවේදනයක් සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පහදන්න.
(4) බාහිර මහජන සම්බන්ධතාවල වැදගත්කම පහදන්න.

05 (1) අන්තර් පුද්ගල සන්නිවේදනය හඳුන්වන්න.
(2) එහිදී නිර්වාචික සන්නිවේදනය යොදා ගන්නා ආකාරය සරලව පහදන්න.
(3) ස්වසංකල්ප යන්න හඳුන්වා ස්වසංකල්ප පෝෂණයේ අවශ්‍යතාවය පහදන්න.
(4) නව මාධ්‍ය භාවිතය පිළිබඳව ප්‍රවණතාවය වර්තමාන සමාජය ඇසුරෙන් පහදන්න.

06 (1) ගෝලීයකරණ සංකල්පය සරලව පහදන්න.
(2) ගෝලීයකරණයේ නව ප්‍රවණතා 4ක් ලියන්න.
(3) විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය යන්න පහදා ලක්ෂණ 4ක් ලියන්න.
(4) පුරවැසි මාධ්‍යකරණය පිළිබඳව අධ්‍යතනයේ පවතින අවස්ථා පිළිබඳව එහි ලක්ෂණ හා වාර පිළිබඳව ද අවධානය යොමු කරමින් විස්තර කරන්න.

07 (1) සන්නිවේදනයේ අරමුණු 4ක් නම් කරන්න.
(2) සමූහ සන්නිවේදනයේ ලක්ෂණ 4ක් නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.
(3) අවිධිමත් සන්නිවේදනය සතු ලක්ෂණ 3ක් විස්තර කරන්න.
(4) සාර්ථකව වාචික සන්නිවේදනයේ යෙදීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 4ක් පැහැදිලි කරන්න.